# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/64 – 2022 ඔක්තෝබර් 15 වැනි සෙනසුරාදා – 2022.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2021/100.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

අයි. ඩී. එස්. සමරනායක මයා, අංක 114/එෆ්, ගැටේමාවරය, තුම්මෝදර.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, අනගාරික ධර්මපාල මාවත, අංක 32/26එල්, එම්. එම්. අයි. ආර්. ඒ. ජයතිලක මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: IR/COM/04/2021/100.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

අයි. ඩී. එස්. සමරනායක මයා, අංක 114/එෆ්, ගැටේමාවරය, තුම්මෝදර.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ පැරණි බඳවා ගැනීමේ පටිපාටියෙන් වසර 5න් 5ට ලබාදෙන ලද උසස්වීම් අනුව, 1996.01.28 දින සිට කොන්ත්‍රාත් පදනමෙන් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත ආරක්ෂක නිලධාරියෙකු ලෙස සේවයට බැඳී සේවය කළ අයි. ඩී. එස්. සමරනායක මහතාට, 2001 වසරේ සිට 2019.11.06 දක්වා විශ්‍රාම ගැන්වෙන අවස්ථාව වන විට උසස්වීම් ලෙස, 2001 වසරේ දී OIC තනතුර ද, 2006 වසරේ දී CSO තනතුර ද, 2011 වසරේ දී A/D තනතුර ද, 2016 වසරේ දී S/D තනතුර ද, යන තනතුරු හිමි ද, හිමි නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 - 0126

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.